## ශීර්ෂය - 261 ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

------------------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) පුනරාවර්තන වියදම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් අගය රු.221,504 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ඡේදයේ සඳහන් බැරකම් සිගාස් පරිගණක වැඩසටහනට ඇතුළත් කළද පරිගණක මුද්‍රිත සටහන්වල පෙන්නුම් කර නොමැති අතර බැරකමක් ලෙස හඳුනාගෙන වියදම් උද්ගතවී ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. | නිවැරදි තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට ක්‍රියා කළ යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම් වූ ගොඩනැගිලි සහ මෝටර් රථ හා යන්ත්‍රෝපකරණ අයිතමයන්ගේ දෙපාර්තමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාරයේ SA 82 ආකෘතිය අනුව ආරම්භක ශේෂයේ රු.මිලියන 33.969 ක වෙනසක් හා මිලදී ගැනීම්වල රු.මිලියන 2.438 ක වෙනසක් නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල **5** කින් මෙම වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස ඇතුළත් කළ ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ අගයන් කිහිපයක් ආරම්භක ශේෂ තීරුවට එකතු වීම මෙම වෙනසට හේතු වී ඇත.<br><br>අවසාන ගිණුම් සකස් කිරීම දක්වාම නිවැරදි කර නොමැති අතර මුදල් අමාත්‍යාංශය මගින් දෙන ලද උපදෙස් අනුව කටයුතු කරමි. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් සසඳා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පියදිගම ශිෂ්‍ය බලඇණිය ගොඩනැගිල්ල, මාදම්පාගම නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි තක්සේරුකර වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ගොඩනැගිල්ල තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට 2022 අප්‍රේල් 19 දින යොමු කර ඇති අතර එම වාර්තාව ලද පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු සියළුම වත්කම් තක්සේරු කර වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (iii) | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු කැබ් රථ තුනක වටිනාකම වූ රු.මිලියන 41.985 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මෙම කැබ්රථවල වටිනාකම 2022 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී තිබූ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් වසා දමන ලද පාසැල් 78 ක ඉඩම් අක්කර 107 ක් හා ගොඩනැගිලි 125 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මෙම පාසල් ඉඩම් හා ගොඩනැගිලිවල භුක්තිය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා ඇත්නම් එම දේපල තක්සේරුකර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. | ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පවරා ඇති සියළුම ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (v) | සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව රත්ගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රු.2,188,816 ක් වූ ස්ථාවර වත්කම් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව වටිනාකම රු.1,998,756 ක් වූයෙන් රු.190,060 ක වෙනසක් විය. | වටිනාකම රු.379,500 ක් සිගාස් වැඩසටහනට ඇතුලත් කිරීමේදී ආරම්භක ශේෂයට එකතු වීම. තවද වැය විෂය අංක 2103 යටතේ මිල දී ගැනීම් රු.569,500 ක් ලෙස සටහන් වීම හේතු වී ඇත. | විගණනයට නිවැරදි තොරතුරු ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලැබී තිබුණු රු.මිලියන 109.4 ක් වූ වැය විෂයයන් 7 කට අදාළ වත්කම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් ලෙස පවරාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් අත්පත් කරගැනීම්වලට අයත් වන්නේ 261 ට අදාළ වැය විෂය අංක 2101 සිට **2105** දක්වා වන වැය විෂයන් යටතේ අත්පත් කරගන්නා වත්කම් පමණි. අනෙකුත් අමාත්‍යාංශවල වත්කම් අදාළ අමාත්‍යාංශ විසින් ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරයි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ලබාදී තිබුණු වත්කම්වල අයිතිය දිස්ත්‍රික් ලේකම් සතු වන බැවින් එම වත්කම් ශීර්ෂ අංක 261 යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීම සාධාරණ බව පෙනේ. |
| (vii) | ගාල්ල දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ලේ අංක 05 සහ අංක 06 මහල් ඉදිකිරීම වෙනුවෙන් පළාත්සභාව විසින් දරා ඇති හා එම ගිණුම්වලට ඇතුළත් වී තිබූ රු. මිලියන 55 ක මුදල 261 වැය ශීර්ෂය යටතේ මූල්‍ය නොවන වත්කම් වටිනාකමට ඇතුළත් කර තිබූ හෙයින් ගොඩනැගිලි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2003 වර්ෂයේ දී මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේදී ප්‍රතිපාදන හිඟ වීම මත 05 වන හා 06 වන මහල් ඉදි කිරීම සඳහා දකුණ පළාත් සභාව විසින් රු.55,000,000 ක් දරා ඇත.<br><br>මෙම ගොඩනැගිල්ල තක්සේරු කිරීමේදී සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහාම තක්සේරුව ලබා ගෙන ආති බැවින් , එහි සම්පූර්ණ වටිනාකම 261 වැය ශීර්ෂය යටතේ ගිණුම්ගත කරඇති බව කාරුණිකව දන්වමි. | මූල්‍ය නොවන වත්කම් වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |

**(ඇ) අග්‍රිම ශේෂය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2006 වර්ෂයේ සිදුවී තිබුණු චෙක්පත් වංචාවක් හේතුවෙන් අග්‍රිම ගිණුමෙහි දක්වා තිබූ රු.194,086 ක් වූ නොපියවූ අග්‍රිම ශේෂය වසර 15 කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වූ චෙක්පත් වංචාවක් හේතුවෙන් රු. 194,086/- ක් වූ මෙම අග්‍රිම ශේෂය ඇති වී තිබේ. මේ සම්බන්ධයෙන් බලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 93067 යටතේ නඩුවක් විභාග වෙමින් පවතින අතර, ගාල්ල දිසා අධිකරණයේ අංක 8518/M යටතේ විභාග වූ නඩුවෙහි තීන්දුව මේ වන විට ප්‍රකාශයට පත් කර ඇත. | නඩුවේ තීන්දුව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ඈ) **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භක මුදල් ශේෂය රු.194,086 ක් මුදල් ප්‍රවාහයේ අවසාන ශේෂය ගණනයේදී ගැලපීම් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන මුදල් ශේෂය ගැලපීමේදී පසුගිය වර්ෂයේ අවසාන ශේෂය භාණ්ඩාගාරයට පියවා නැවත ප්‍රවර්තන වර්ෂයේ අග්‍රිමයට බැර කරන්නේනම් සටහනක් මඟින් ඒ බව අනාවරණය කළ යුතුව තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මින් ඉදිරියට මෙම කරුණ සටහනක් මඟින් අනාවරණය කිරීමට කටයුතු කරමි. | පිළිතුර පරිදි කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අතිකාල හා නිවාඩු දින වැටුප්, කොවිඩ් 19 හේතුවෙන් නිවසේ නිරෝධායනය වන හා ජීවනෝපාය අහිමි වූ පවුල් සඳහා සහනාධාර ලබා දීම හා කාර්යමණ්ඩල පුහුණු වැය විෂය 3 හි පිළිවෙලින් රු.මිලියන 1,350 ක හා රු.මිලියන 119.725 ක හා රු.මිලියන 3.186 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | 1002 වැය විෂයයේ ප්‍රතිපාදන මාරු කරගෙන ඇති අතර එම ප්‍රතිපාදන සියල්ල උපයෝජනය කරගෙන ඇත.<br><br>නිරෝධායනය වූ පවුල් පිළිබඳ තොරතුරු ප්‍රමාදවී ලැබීම හා චක්‍රලේඛ ප්‍රකාරව ජීවනෝපාය අහිමි වූ අඩු ආදායම්ලාභී පවුල් සඳහා පමණක් රු.2,000 දීමනාව ලබා දීමට කටයුතු කළ බැවින් මෙම ප්‍රතිපාදන ප්‍රමාණය ඉතිරි වී ඇත.<br><br>පුහුණු වැඩසටහන් ආරම්භ කර නොතිබීම. | අවශ්‍යතා හඳුනාගෙන මුදල් මාරු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු 12 කින් ලද රු. මිලියන 2,361.737 ක ප්‍රතිපාදන වලින් රු. මිලියන 777.424 ක් පමණක් වැය කර තිබුණු බැවින් සියයට 33 ක ප්‍රතිශතයක් උපයෝජනය කරගෙන නොතිබුණි. | 2021 වර්ෂය තුළ අපේක්ෂා කළ පරිදි වැඩ කොටස් අවසන් කිරීමට නොහැකි වීම, අක්මුදල් නොලැබීම, අමුද්‍රව්‍ය සපයාගත නොහැකි වීම, වවුචර් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය යනාදී කරුණු හේතු වී ඇත. | වෙනත් දෙපාර්තමේන්තුවලින් ලැබෙන මුදල අදාළ කාර්යයන් ඉටු කිරීමට යෙදවිය යුතුය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ---------------------------------- | ----------- |
| (ආ) | 2021වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන හා අනෙකුත් ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21 කට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු අතැති බිල්පත් වටිනාකම රු.මිලියන 220.551 ක් විය. | ප්‍රතිපාදන සපයා ගැනීමකින් තොරව සාමාන්‍යයෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන අතර 2021 වසරේදී එවැනි කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවිණි. නමුත්, අක්මුදල් ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද වන අතර ඒම හේතුවෙන් අතැති බිල්පත් ඇතිවී ඇත.<br><br>ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කෙරෙනුයේ එක් එක් රේඛීය අමාත්‍යාංශ මගින් ජාතික අයවැයෙන් අනුමත සීමාව තුළ වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඉදිරිපත්වන බිල්පතට අදාල වටිනාකම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමෙන් අනතුරුව අක් මුදල් හිමිවේ. බිල්පත් ඉදිරිපත්වූ බව දැනුම් දී මාස 02ක් ගත වුවද අක්මුදල් නොලැබෙන අවස්ථා ඇත. එම හේතුවෙන් අතැති බිල්පත් ඇතිවී ඇත. | අතැති බිල්පත්වලට අවශ්‍ය අක්මුදල් කඩිනමින් ලබාගෙන බිල් පත් පියවීමට කටයුතු කළ යුතුය. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 ට අයත් සමෘද්ධි ප්‍රජා මූල බැංකු 68 මගින් ණයකරුවන් 669,338 ක් වෙත ගෙවා තිබුණු එකතුව රු.මිලියන 21,598 ක් වූ ණය මුදලින් රු.මිලියන 505.188 ක මුදලක් කල්පසු වූ ණය ලෙස පැවති අතර ණයලාභීන් 3,408 ක් වෙත ගෙවා තිබුණු එකතුව රු.මිලියන 160.755 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි. එම ණය කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. තවද ණයලාභීන් 114,088 ක් සඳහා ගෙවා තිබුණු රු.මිලියන 5,096 ක් හිගහිටි ණය ලෙස හඳුනාගෙන තිබුණි. | කල්පසුවූ ණය හා බොල් ණය අය කිරීම සඳහා නඩු හා නීති ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. කොවිඩ් 19 වසංගතය, පොහොර නොමැති වීම, සංචාරක ව්‍යාපාරය අඩපණ වීම, ණය සහන කාල සීමාවන් ලබා දීම වැනි හේතූන් නිසා එය හිඟ හිටි ණය ලෙස පවතී. | ලබා දී ඇති ණය සම්බන්ධයෙන් පසු විපරම් කර අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 හා සමෘද්ධි බැංකු 68 ක් මගින් රුපියල් මිලියන 483.56 ක් ප්‍රතිලාභීන්ට ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | සමෘද්ධි බැංකු සතු අරමුදල් වලින් රු. මිලියන 483.56 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් සමෘද්ධි දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරන පදනමින් ප්‍රතිලාභීන් වෙත ලබාදී ඇත. එහෙත් මෙතෙක් මහා භාණ්ඩාගාරය වෙතින් කිසිදු දිස්ත්‍රික්කයකට මෙම මුදල් ප්‍රතිපූර්ණය කර නොමැත. | ප්‍රතිපූර්ණය කර ගතයුතු මුදල කඩිනමින් ප්‍රතිපූර්ණය කරගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | දෙවන පියවර යටතේ ස්මාර්ට් ශ්‍රී ලංකා වැඩසටහන මගින් දිස්ත්‍රික් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන පිහිටුවා slieg.app පරිගණක මෘදුකාංගය හරහා රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීමට කටයුතු සලසා තිබුණද ව්‍යාපෘතිය අතරමග නවතා දැමීම නිසා ලබා දී තිබුණු පරිගණක 38 ක් ඌණ උපයෝජිතව පැවතුණි. | මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදෙන ලද පරිගණක අදාළ දෙපාර්තමේන්තු නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් රාජකාරි කටයුතු සඳහා දැනට භාවිත කරනු ලබන අතර දිස්ත්‍රික් මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමෙන් හා අනෙකුත් පහසුකම් සපයා ගැනීමෙන් පසුව, දැනට මෙම ව්‍යාපෘතියේ වගකීම පැවරී ඇති ජාතික ආයතනය වන මිනිස්බල | වැඩසටහන ක්‍රියාත්මක කිරීමට වගකීම් පැවරී ඇති ආයතනය අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු අතර පරිගණක භාවිතයට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ සහයෝගය, මඟ පෙන්වීම හා උපදෙස් අනුව, ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | |
| (ඈ) | Integrated Treasury Management Information System (ITMIS) වැඩසටහන සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.මිලියන 7.8 ක් වූ ලැප්ටොප් පරිගණක 48 ක් 2018 වර්ෂයේ සිට වැඩසටහන සඳහා උපයෝජනය කර නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8ක් තුළ නිශ්කාර්යව පැවතුණි. | ITMIS වැඩසටහන 2022 මාර්තු 01 සිට ක්‍රියාත්මක වීම ආරම්භ වීමත් සමඟ ඒ සඳහා ලද පරිගණක අදාල වැඩසටහන සඳහා මේ වන විට යොදවා ඇති බව කාරුණිකව දන්වමි. | නිශ්කාර්යව පවතින පරිගණක උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට අංක 14/2019 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිළිවෙලින් වර්ෂ 25 ක්, වර්ෂ 13 ක් හා වර්ෂ 10 කට වඩා කාලයක් තුළ ලිපිගොනු 13 ක්, 16 ක් හා 11 ක් විශ්‍රාම වැටුප් සංශෝධනයන් කර නොතිබුණි. | සංශෝධන සකස් කර ගෙවා ඇති විශ්‍රාම වැටුප් ගොනු ගණන 19 කි. වඳුරඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාරුකළ ගොනු ගණන 7කි. සංශෝධනය හිමි නොවන ගොනු ගණන 5 කි. මිය ගිය හා ගෙවීම් නතර කර ඇති ගොනු ගණන 4 කි. තව දුරටත් සකස් කිරීමට ඇති ගොනු 05 ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට ඇත. | යාවත්කාලීනව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | **සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021** | | |
| (i) | මුදල් අමාත්‍යාංශය යටතේ ඇති සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක සෞභාග්‍යා වැඩසටහන යටතේ ලුණු ඇඹරීමේ කාර්යය සඳහා මිලදී ගැනීමට අපේක්ෂිත රු.1,050,000 ක් වූ යන්ත්‍රය මිලදී ගෙන නොතිබුණු අතර රු.600,000 ක් වූ යන්ත්‍ර 3 ක් භාවිතයට ගෙන නොතිබුණි. ව්‍යාපෘතිය 2021 ජූනි මාසයේ ආරම්භ කිරීමට නියමිතව | අදාළ ග්‍රාම නිලධාරී වසම් තුනෙහි ප්‍රතිලාභීන් සියලු දෙනා එක්රැස්කර සමිතියක් පිහිටුවා මෙම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සංවිධානය කිරීම හා ලියාපදිංචියට අවශ්‍ය මූලික කටයුතු සිදුකර තිබුණ ද පවුල්වල සාමාජිකයන් කොවිඩ් වසංගත තත්වයට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් සමිතිය ලියාපදිංචිය සිදු කිරීම ප්‍රමාද විය. | සැලසුම් කළ පරිදි හා අරමුණු ඉටුවන පරිදි කාර්යය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද, විගණන දිනය වූ 2022 ජුනි වන විටත් ආරම්භ කර නොතිබුණි.<br><br>තවද ව්‍යාපෘතියට අදාළ මාර්ගයන් සංවර්ධනයට රු.2,500,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, ඒ පිළිබඳව කිසිදු කාර්යයක් සිදු කර නොතිබුණි. අලෙවිය සම්බන්ධයෙන්ද අදාළ කටයුතු සිදු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | |
| (ii) | ලුණු නිෂ්පාදන යන්ත්‍ර තබා තිබුණු ප්‍රජා ශාලාවේ දැල්වැට සකස් කිරීම සඳහා රු.1,600,000 ක්, ජලය ලබා ගැනීමට රු.50,000 ක් හා වැසිකිළි පද්ධතිය පිළිසකර කිරීම සඳහා රු.150,000 ක් අනුමත කර තිබුණද එම ව්‍යාපෘති ඉටු කර නොතිබුණි. | මුදල් ප්‍රතිපාදන වෙන් කළද කිසිදු කොන්ත්‍රාත්කරුවකු ඉදිරිපත් නොවීම නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම. ජල සැපයුම් ලබා ගැනීමට හා වැසිකිලි පද්ධති අලුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු සකස් කළද, යන්ත්‍ර නොලැබීම හේතුවෙන් කටයුතු ඉටු කිරීමට නොහැකි විය. | අදාළ ආයතන හා සම්පත් සමබන්ධීකරණය කරගනිමින් ව්‍යාපෘතිය කඩිනමින් ඉටු කළ යුතුය. |
| (iii) | ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට රු.මිලියන 5.5 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණු ව්‍යාපෘති 04 ක වැඩ ආරම්භ කර නොතිබුණි. | උග්‍ර අමුද්‍රව්‍ය හිඟය නිසාත් ව්‍යාපෘති 2022 වර්ෂයට අවිච්ඡේද නොකිරීමට උපදෙස් ලබා දීම නිසාත් මෙම ව්‍යාපෘති 4 මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | වෙන්කළ ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | කරුවලබැද්ද අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදන ගොඩනැගිල්ලට පිවිසෙන මාර්ගයේ පැතිබැම්ම සහිතව සංවර්ධනය කිරීම සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන මුදල රු.2,000,000 ක් වුවද ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය හේතුවෙන් රු.1,404,994 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර ගෙන තිබුණි. | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 3/2022 හා 2022 අප්‍රේල් 26 දිනැති චක්‍රලේඛය යටතේ රටේ පවතින අයහපත් ආර්ථීක වාතාවරණය තුළ අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. ඉතිරි කටයුතු 2022 වර්ෂයේ දෙවන කාර්තුවේ සිදු කිරීමට අනුමත වී තිබුණි. | - එම - |

**(උ) අයහපත් කාලගුණය නිසා විපතට පත් ජනතාව නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය**

| | | | |
|---|---|---|---|
| (i) | මෙම ව්‍යාපෘතිය යටතේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගනේගම දකුණ උඩදෙනියවත්ත හි පදිංචිකාරියකට නිවස ඉදිකිරීම සඳහා රු.1,300,000 ක් ලබා දී තිබුණ ද, විගණිත දිනය වූ 2021 ඔක්තෝම්බර් 12 දක්වාම නිවසේ වැඩ කොටස් සම්පූර්ණ කර නොතිබුණු අතර එම තැනැත්තිය එකී අවදානම් සහිත නිවසේම රැඳී සිටින බව නිරීක්ෂණය විය. | නිවස ඉදිකිරීම වෙනුවෙන් මෙතෙක් ලබා දී ඇති රු.900,000 මුදලට සරිලන වැඩ කොටසක් එම ප්‍රතිලාභියා විසින් නිම කර ඇති බවට තාක්ෂණ නිලධාරී මඟින් තහවුරු කර ඉදිරිපත් කරමි. | ප්‍රතිලාභ ලබාදී තිබියදී අවදානම් ප්‍රදේශයෙන් ඉවත් නොවීම සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ii) | වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වාඩුවැලිවිටිය උතුර ග්‍රාම නිලධාරී වසමෙහි පදිංචිකරුවන් දෙදෙනකුට නිවාස ඉදිකර ගැනීම සඳහා එකතුව රු.2,822,000 ක් වැඩසටහනෙහි මාර්ගෝපදේශයන්ට පටහැනිව වාරික නිදහස් කර තිබුණි. විධිමත් ගිවිසුම්ගත වීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 20 දින එක් පුද්ගලයකු එකී ඉඩම හා නිවස වෙනත් පුද්ගලයෙකුට විකුණා තිබුණු අතර 2019 මැයි 15 දින අනෙක් පුද්ගලයා විසින් ඔහුගේ ඉඩම රු.700,000 කට උකස්කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රතිලාභියා විසින් ඉඩම විකුණා ඇති බවට දැනගත් වහාම ඒ පිළිබඳව ඉදිරි උපදෙස් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, ආපදා සහන සේවා මධ්‍යස්ථානය දැනුවත් කිරීමට කටයුතු සිදු කරන ලද අතර මේ සම්බන්ධයෙන් ඇල්පිටිය පොලිස් අපරාධ විමර්ශණ අංශය වෙතද පැමිණිල්ලක්ද ඉදිරිපත් කරන ලද බව කාරුණිකව සඳහන් කරමි. මේ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව උපදෙස් අදාළ ආයතනවලින් ඉල්ලා ඇත. | සිදුවීම සිදුව වසර 2 ½ කට අධික කාලයක් ගතවී ඇති බැවින් ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | සම්පූර්ණ මුදල වූ රු.1,123,000 ක් ලබාගත් වාඩුවැලිවිටිය උතුරෙහි පදිංචිකරුවෙකු නිවසේ වැඩ සම්පූර්ණ කර නොතිබුණි. නුගේතොට පදිංචිකාරියකුට රු.900,000 ක් ලබාදී තිබුණු අතර විගණන දිනය වූ 2021 නොවැම්බර් 11 දින දක්වාම ආපදාවට ලක්වූ නිවසෙහිම පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය. | මේ වන තෙක් සිව්වන වාරිකය ගෙවීමට සුදුසු වන පරිදි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කොට නොමැති බැවින් අදාළ මුදල නිදහස් කොට නොමැති බව කාරුණිකව සඳහන් කරමි. ඉදිරියේදී කිසිදු ආධාර මුදලක් ලබා නොගෙන ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කරන බව ඒ මහත්මිය ප්‍රකාශ කොට ඇති අතර එසේ ඉදිකිරීම් සම්පූර්ණ කොට ආපදාවට ලක්වූ නිවස කඩා ඉවත් කිරීමෙන් පසු ඒ අනුව ඉදිරි ගෙවීම් කටයුතු සිදු කරනු ලබන බවද වැඩිදුරටත් සඳහන් කරමි. | ප්‍රතිලාභ ලබාගත් ප්‍රතිලාභීන් අදාළ අරමුණට අනුව කටයුතු කර ඇද්ද යන්න පරීක්ෂා කර පසු විපරම් සිදු කර අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ගාල්ල ආසන 2000 ක ශ්‍රවණාගාරය ඉදි කිරීමට 2019 වර්ෂයේදී රු.මිලියන 2,656.877 ක ගිවිසුමකට එළඹ තිබුණි.<br><br>මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මුල් ඇස්තමේන්තුව රු.මිලියන 1,700 ක් වුවද, අමාත්‍ය මණ්ඩල තීරණ අනුව අවස්ථා දෙකකදී පිළිවෙලින් රු.මිලියන 2,657 ක් හා රු.මිලියන 3,155 ක් දක්වා සියයට 86 කින් ඇස්තමේන්තුව වැඩි කර තිබුණි. මීට ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකිරීම හේතු වී තිබුණි. | මෙම විගණන විමසුම, විගණන හා කළමනාකරණ කමිටුවේ දී තීරණය කළ පරිදි ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දන්වා ඇත. | පිරිවැය ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල කළ යුතුය |
| (ii) | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු අතර රු.මිලියන 874.785 ක් වූ ගෙවා ඇති බිල් හා අතැති බිල් පැවති අතර භෞතික ප්‍රගතිය සියයට 15 ක තරම් අඩු මට්ටමක විය. නිම කළ වැඩවලට ගෙවිය යුතු මුදල රු.මිලියන 238.953 ක් විය. | - එම - | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කළ යුතුය. |
| (iii) | 2022 පෙබරවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ව්‍යාපෘතියේ නොනිමි ගොඩනැගීම් වෙනත් කාර්යක් සඳහා යොදා ගැනීමට හැකියාව පවතින්නේද යන්න පිළිබඳව පරීක්ෂා කර වාර්තා | - එම - | ව්‍යාපෘතියේ නොනිමි ගොඩනැගීම් වෙනත් සුදුසු ඵලදායී කාර්යයක් සඳහා හෝ යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීමට උපදෙස් දී තිබුණද, 2022 මාර්තු 31 දක්වාම එම කටයුතු සිදු කර නොතිබුණි. | | |
| (iv) | ශ්‍රවණාගාරයේ ඉදි කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීමකින් තොරව සිදු කිරීම හේතුවෙන් ඒ සඳහා වැය කළ රු.මිලියන 874 අනාර්ථික වියදමක් වී තිබුණි. ඉදි කිරීමට ගෙනවිත් තිබුණු විවිධ වානේ වැරගැන්නුම්, වානේ පයිප්ප හා ඉදි කිරීම් කාර්යය සඳහා භාවිතා කරන වෙනත් උපකරණ විශාල ප්‍රමාණයක් ව්‍යාපෘති භූමියේ ස්ථාන කිහිපයක අනාරක්ෂිතව ගොඩගසා තිබුණි. ඉදිකර තිබූ තාවකාලික ගොඩනැගිල්ල නිෂ්කාර්යව තිබුණි. ව්‍යාපෘතිය සඳහා පවරා ගන්නා ලද හෙක්ටයාර 2.709 ඉඩමද ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | - එම - | ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර වැය කළ මුදලට ඵලදායීතාවයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (v) | කුලී වැඩ හා අත්තිකාරම් යටතේ ගාල්ල ආසන 2000 නව ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ලබාදුන් වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 135.139 ක් වූ අත්තිකාරම් 03 ක්ද වර්ෂයක් ඉක්මවූ එකතුව රු.මිලියන 199.949 ක් වූ අත්තිකාරම් 03 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එකතුව රු.මිලියන 335.088 ක අත්තිකාරම් ශේෂයක් පැවතුණද එම අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | නොපියවූ කුලී වැඩ අත්තිකාරම් මුදල් පියවීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා වෙන් කර තිබුණු රු.මිලියන 250 ක ප්‍රතිපාදන වලින් රු. මිලියන 174.793 ක් ඉතිරි වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පිළිගතහැකි හේතු පැහැදිලි කිරීමක් කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා කැබිනට් අනුමැතිය නොලැබීම නිසා 2021 ජනවාරි 29 දිනෙන් පසුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ නොකිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. එම ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශය වෙත යවා ඇත. | ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කරගැනීමට ක්‍රියා කළ යුතුය. |

(ඵ) සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන

| | | | |
|---|---|---|---|
| (i) | 2021 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයෙන් වැඩසටහන සඳහා ලැබුණු ප්‍රතිපාදන මත සියයට 7 ක සහන පොලී අනුපාතයක් යටතේ ලක්ෂ 20 ක් දක්වා ණය මුදලක් ලබා දීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණද ඒ යටතේ මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් වෙත රු.මිලියන 4.140 ක් ද, සමෘද්ධිලාභී තරුණ ව්‍යවසායකයින් 25,000 ක් ඉලක්ක කරගෙන ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා ගෘහස්ථ වෙළඳසැල් පිහිටුවීමට වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් වෙත රු.මිලියන 2.417 ක් ද, හබරාදූව ප්‍රාදේශීය ලේකම්ට රු.මිලියන 3.897 ක්ද ලබා දී තිබුණි. මාදම්පාගම හා හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රතිලාභීන් 9 ක් තෝරාගෙන එක් අයෙකු සඳහා පමණක් රු.500,000 ක් ගෙවා තිබුණි. | මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩසටහන සඳහා 2021 දෙසැම්බර් 31 දින වන විට එයට අදාල සියළු ප්‍රසම්පාදන කටයුතු අවසන්කර ඇත.<br><br>හබරාදූව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ප්‍රතිපාදන නොලැබීම මත වැඩසටහන ක්‍රියාත්මක වී නැත.<br><br>වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තෝරාගත් ප්‍රතිලාභීන් නව දෙනාගෙන් එක් අයකු පමණක් ස්වකැමැත්තෙන් සමෘද්ධි සහනාධාර පත්‍රය නැවත භාර දීම සිදු කොට ඇති අතර අදාළ ප්‍රතිලාභියාට රු.500,000 ක ණය මුදලක් නිකුත් කොට ඇති බව කාරුණිකව සඳහන් කරමි. | සැලසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ii) | අදාළ වැඩසටහන්වල කාර්යයන් ඉටු කිරීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණු අතර 2021 දෙසැම්බර් 07 දින වැඩසටහන යටතේ ලබා දී තිබුණු ප්‍රතිපාදනය වූ රු.මිලියන 5.074 ක මුදලින් රු.මිලියන 2 ක මුදල ආපසු පවරා ගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු ප්‍රතිපාදන මුදලින් සියයට 39 ක් උපයෝජනය නොකර ආපසු හරවා යවා තිබුණි. | රටේ පැවති අයහපත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති කිහිපයක් සිදුකිරීමට නොහැකිවූ අතර එම තත්ත්වය පහව යාමෙන් පසු 2021 වර්ෂයේ අවසාන කාර්තුවේ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද දිස්ත්‍රික්කයේ වෙනත් කාර්යාලයක උපයෝජනය සඳහා එම ප්‍රතිපාදන පවරා දී ඇත . | COVID 19 වසංගතයත් සමග කඩාවැටුණු ජීවනෝපායන් ගොඩනැගීමේ අරමුණින් ගෘහ ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා සැලසුම්කර තිබූ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

(ඒ) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රදේශීය ලේකම් කොට්ඨාස 19 කට අදාළව ලියාපදිංචි කරන ලද ග්‍රාමශක්ති ජනතා සමිති 228 න් 2021 දෙසැම්බර් 31 දින වන විට ජනතා සමිති 214 ක් අක්‍රීය මට්ටමේ පැවති අතර එම අක්‍රීයව පවතින සමිතිවල බැංකු තැන්පතු වශයෙන් රු.මිලියන 98.383 ක ශේෂයක් නිශ්ක්‍රීයව පැවතුණි. සියළුම සමිති රාජ්‍ය බැංකුවල තැන්පත් කර ඇති රු.මිලියන 104.240 ක් ව්‍යාපෘති ක්‍රියාකාරකම් නවතා තබා තිබීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි. | අමාත්‍යාංශය මගින් මේ සඳහා සමිති ක්‍රියාකරකම් පිළිබඳව ඉදිරියේ දී යම් ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ලබනු ඇත. ඒ අනුව, ඉදිරියේදී මෙම සමිති සක්‍රීයකර ක්‍රියාත්මක කිරීමට හැකියාව පවතී. | වැඩසටහනේ අරමුණු ක්‍රියාත්මක කිරීම වසර ගණනාවක සිට අඩාල වී ඇති බැවින් හා ඊට නිසි උපදෙස් නොලැබීම නිසා අක්‍රීය බැංකු ශේෂ සම්බන්ධයෙන් කාලෝචිත පියවර ගත යුතුය. |
| (ii) | අභ්‍යන්තර පාලන පද්ධති දුර්වල වීම නිසා අදාළ ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක නොවීමෙන් 2018 හා 2019 වර්ෂවල මේ වෙනුවෙන් දරන ලද රු.මිලියන 124.370 ක් වූ වියදම නිශ්කාර්ය වී තිබුණි. | වැඩසටහන සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ නිසි උපදෙස් නොලැබීම නිසා ග්‍රාම ශක්ති සමිති ක්‍රියාකාරී මට්ටමේ පවත්වා ගැනීමට නොහැකි වීම. | නිරීක්ෂණයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් සෘජු පිළිතුරක් ලබා දිය යුතුය. |
| (iii) | 2021 මාර්තු 22 දිනැති දිස්ත්‍රික් ලේකම්වරුන් අමතන ලද ලිපිය අනුව ග්‍රාම ශක්ති ව්‍යාපාරයේ පවතින මුදල් වඩා ඵලදායීව සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමේ අවශ්‍යතාවය පවතින බව දක්වා තිබුණු නමුත් මේ දක්වා ඒ සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. | දැනට ග්‍රාමශක්ති සමිතිවල ගිණුම්හි පවතින මුදල් වඩාත් ඵලදායීව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා යොදවා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව, විමසන ලද තොරතුරු සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. | ලංකාවේ වර්තමානයේ පවතින උග්‍ර මූල්‍ය හිඟයට සුළුවෙන් හෝ පිටුවහලක් වීමට මෙම අක්‍රීය බැංකු ශේෂ ඵලදායීව උපයෝජනය කර ගත යුතුය. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස්කර අවශ්‍ය අංශ වෙත ඉදිරිපත්කර ඇති බවත්, අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා ඉදිරිපත් කර ඇති බවත්, විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පවත්වා ඇති බවත්, එම කමිටුවේ නිර්දේශයන් සම්බන්ධයෙන් පසු විපරම් කරන බවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ විගණන හා කළමනාකරණ කමිටු 39 ක් පවත්වා ඇති බවත් කාරුණිකව දන්වමි. | ජාතික විගණන පනතේ **38** වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර විගණනයට වාර්තා කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේමුදල් රෙගුලාසි 104(4) | 173,840 | කැබ් රථයක් 2021 ජුනි 19 දින අනතුරට ලක්ව තිබුණු අතර සිදුවූ හානිය ප්‍රතිපූර්ණය කරගැනීම සඳහා රු.173,840 පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි. රියදුරුගේ නොසැලකිල්ල මත අදාල අනතුරු සිදු වී තිබුණද 2022 අප්‍රේල් 30 දින වන විට වාහනය අනතුරට ලක් වී මාස 10 ක් ගතවී තිබුණද අනතුර සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් 2022 මැයි 31 දිනට ප්‍රථම කමිටු වාර්තාව ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරමි. | කඩිනමින් පරීක්ෂණ වාර්තා ලබාගෙන අවශ්‍ය සියළු කටයුතු සිදු කර වාර්තා කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25,000ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙනෙ අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත් 2020 හා 2021 වර්ෂවල ඊට අනුකූලව කටයුතු නොකළ වාහන 07 ක් පැවතුණි. | 2020 හා 2021 වර්ෂවල ඉන්ධන තුලන පරීක්ෂාව නිසි පරිදි සිදු කර නොමැති අතර, මෙම වර්ෂයට අදාළව වාහන 05ක ඉන්ධන තුලන පරීක්ෂාව සිදු කර ඇත. | අදාළ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය යෙදිය යුතු වුවත්, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන 04ක රාජ්‍ය ලාංඡනය යොදා නොමැති වාහන ධාවනයේ යොදවා තිබුණි. | කඩිනමින් මෙම සියළු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව සඳහන් කරමි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |

## 2.6 අවිධිමත් ගනුදෙනු

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------- | --------------------------------- | ----------- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිකිරීම | | |
| (i) | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ජේදයේ 2.3.1 උප ඡේදයට අනුව රු.30,175 කට වඩා වැඩි වැටුපක් ලබන මාණ්ඩලික නිලධරයන් හට වර්ග අඩි 1991 ක ප්‍රමාණයකට රජයේ නිවාස ලබාදිය යුතු වුවත් ඊට පටහැනිව වර්ග අඩි 10,015 ක නිවසක් ඉදිකර තිබුණු අතර 2020 වර්ෂයේ අප්‍රේල් සිට 2021 දෙසැම්බර් දක්වා දිසාපති නිලනිවස සඳහා නඩත්තු වියදම් පමණක් රු. මිලියන 1.504 ක් වී තිබුණි. | දිස්ත්‍රික්කයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරියාගේ නිල නිවස බැවින් ඒ අනුව ගැලපෙන පරිදි සැලසුම් සකස් කර ඇත. දිසාපති නිල නිවසෙහි 2020 අප්‍රේල් සිට 2021 දෙසැම්බර් දක්වා ජලය, විදුලිය, වරිපනම් හා ආරක්ෂක ගාස්තු සඳහා රු.1,504,688 ක වියදමක් දරා ඇති අතර ඉන් රු.1,361,662 ක් වියදම් වී ඇත්තේ ආරක්ෂක සේවාව වෙනුවෙන් බව කාරුණිකව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) | දිසාපති නිල නිවස ඉදිකරන අවසථාවේදී එම කොන්ත්‍රාත් ආයතනය මඟින් අවිධිමත් පරිදි රු.මිලියන 3.948 ක අතිරේක වැඩ විෂයයන් එක් කරමින් එම කර්මාන්තයට අදාලත්වයක් නොමැති එහෙත් ඊට යාබද ගේබියන් බැම්ම ඉදි කිරීමේ කර්මාන්තයට අදාළව වර්ෂා ජලය බැසයාමට කාණු පද්ධතියක් ඉදිකර තිබුණි. | මෙම කාණු පද්ධතිය ඉදිකිරීමේ කටයුතු නිල නිවස ඉදි කිරීමෙන් පසු සිදු කිරීම ප්‍රායෝගික බැවින්ද එය අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතු කාර්යයක් බැවින් ද දිසාපති නිල නිවසේ ආරක්ෂාව සඳහා වූ අමතර කාර්යයක් ලෙස ඇතුළත් කර සිදු කර ඇත. | සැලසුමට සියළුම ඉදි කිරීම් ඇතුළත් කර ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කළ යුතු අතර අතිරේක වැඩ සඳහා අදාළ අනුමැතිය ලබාගත යුතුය. |

(ආ) දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිරිපස ගේබියන් රුඳවුම් බැම්ම ඉදිකිරීම

| | | | |
|---|---|---|---|
| (i) | බටගන්විල දිස්ත්‍රික් ලේකම් නිල නිවස ඉදිරිපස ගේබියන් රුඳවුම් බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.මිලියන 8.025 ක් වැය කර තිබුණි. ගේබියන් රුඳවුම් බැම්ම ඉදිකිරීමට මත්තෙන් නිල නිවස පිහිටි භූමියෙහි ඇතිව තිබූ නායයාමෙන් අනතුරුව 2018 මැයි 15 දින ගොඩනැගිලි පර්යේෂණායතනය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදුකොට තිබුණු අතර වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. එහි සඳහන් නිර්දේශවලට අනුගත වීමෙන් තොරව ගේබියන් බැම්ම ඉදිකිරීම හේතුවෙන් 2019 ඔක්තෝබර් 24, 25 දෙදින තුළ බැම්මේ කොටසක් පෙරලීගොස් බැම්මට හානි සිදුවී තිබුණි. | ගොඩනැගිලි පර්යේෂණායතනයේ වාර්තාව අනුව දිසාපති නිල නිවස පවතින භූමියේ ජලය බැසයාම සඳහා කාණු පද්ධතියක් සකස් කිරීම නිර්දේශ කර ඇත. නමුත් ඒ වන විට ගේබියන් බැම්ම ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත. ඉහත NBRO වාර්තාවේ නිර්දේශයක් වූ කාණු පද්ධතිය සකස් කිරීමේ කටයුතු දිසාපති නිල නිවස ඉදි කිරීමත් සමඟ සිදු කළයුතු වූ බැවින් ඒ අනුව කාණු පද්ධතිය ඉදි කිරීම සිදු කර ඇත. මෙම ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතින අතරතුර ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් පස් කඩා වැටී බැම්මේ කොටසකට හානි සිදුවී ඇත. | සිදුවූ හානිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිවයුතු නිලධාරීන්ගෙන් හානිය ප්‍රතිපූර්ණය කර ගත යුතුය. |
| (ii) | අදාළ ගේබියන් බැම්ම පෙරලී යාමෙන් පසු එය යථා තත්ත්වයට පත්කිරීම සම්බන්ධයෙන් 2020 අප්‍රේල් 10 දින රු.486,000 මුදලක් අයකරමින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ලබාදුන් වාර්තාවට අනුකූලව හා එහි නිර්දේශ අනුව බැම්ම නැවත පිළිසකර කිරීමේ කටයුතු ගේබියන් බැම්මට හානි සිදුවී වර්ෂ 2 යි මාස 06 කට වැඩි කාලයක් පසුවී තිබුණද, අවසන්කර නොතිබුණි. | බැම්ම යථා තත්වයට පත්කිරීම සඳහා කොන්ත්‍රාත්කරු කිහිපවතාවක් දැනුවත් කර ඇත. නමුත් ඔහු වැඩ ආරම්භ කරන ලද්දේ 2022 වර්ෂයේ ජනවාරි මාසයේ වන අතර ගේබියන් බැම්මේ කොටසක් පමණක් නැවත සකස් කර ඇත. | සිදුවූ හානිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර වගකිවයුතු නිලධාරීන්ගෙන් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. |
| (iii) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව ගේබියන් බැම්ම පෙරළී යාම සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ නොකර බැම්ම පෙරළී | එම කාළය තුල කොන්ත්‍රාත්කරු ලවා බැම්මේ හානියට පත් කොටස යථා තත්වයට පත් කිරීමට උත්සහ දරා ඇති අතර පසුව හානිය තක්සේරු කිරීමේ කමිටුවක් ද | හානිය සිදුවී සාධාරණ කාලයක් තුළ පරීක්ෂණ ආරම්භ නොකිරීම, එම හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම |

| | | | | |
|---|---|---|---|---|
| | | යාමෙන් සිදුවූ හානිය තක්සේරු කිරීමේ කමිටුවක් බැම්ම පෙරලීගොස් වර්ෂයකට පසු එනම් 2020 නොවැම්බර් 16 දින පත්කර තිබුණි. තවද මුදල් රෙගුලාසි 104(3) හා (4) පරිදි සිදුවී තිබුණු හානිය සම්බන්ධයෙන් දින 7ක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාවක් හා මාස 3 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත්කර නොතිබුණි. | පත්කර මේ සම්බන්ධයෙන් කටයුතු කර ඇත. | සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. ස්වාධීන පරීක්ෂණ මණ්ඩලයක් පත්කර වගකිවයුතුන් නිශවය කර මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (iv) | කඩාවැටීමට ලක්වී ඇති ගේබියන් රැඳවුම් බැම්මේ කොටසක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා නිල නිවස පිටුපසට කඩා වැටීම හා ගේබියන් බැම්මේ අනෙක් කොටස නිවස දෙසට යම් නෙරා යාමක් සිදුවී ඇති බැවින් නිවසේ පදිංචිව සිටීම අනතුරු දායක බැවින් එම නිවස වසර 02 ක පමණ කාලයක සිට වසා දමා තිබුණි. | බැම්ම යථා තත්වයට පත් කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. | නිල නිවස භාවිත කළ හැකි තත්ත්වයට පත් කිරීමට අදාළ කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | (i) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 වගන්තියට පටහැනිව දිස්ත්‍රික් ලේකම් නිල රථය වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවල දී ලබාගත් එකතු වටිනාකම රු.280,373 ක් වූ අතිරේක ඉන්ධන ලීටර් 2,609 ක් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ඒ අනුව 2020 හා 2021 වර්ෂවල ඇතැම් මාසවලදී නිල වාහන ඉන්ධන දීමනාව සියලු රාජකාරී ගමන් සඳහා ප්‍රමාණවත් වී තිබියදී අමතර ඉන්ධන දීමනා ලබාගෙන තිබුණු අතර, ඇතැම් මාස වලදී අතිරේක ගමන් අවශ්‍යතාවයන්ට වඩා වැඩියෙන් එකතුව ලීටර් 1,927 ක් වෙනුවෙන් ලබාගෙන තිබුණු රු.207,460 ක් වූ අතිරේක ඉන්ධන දීමනා භාවිතා නොකර අත රඳවාගෙන තිබුණි. | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් 2013 අගෝස්තු 15 හා 16 යන දිනයන්හි පවත්වනු ලැබූ දිසාපති සමුළුවේදී ගනු ලැබූ තීරණයට අනුව, අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති 2013 සැප්තැම්බර් 30 දිනැති ලිපියට අනුව ඉටු කළ වැඩසටහනට, අතිරේක රාජකාරී ඇතුළත්කර අනුමැතිය ලබා ඇත්නම් අදාළ අතිරේක ඉන්ධන ලබා ගැනීමට හැකියාව ඇත. දිස්ත්‍රික් ලේකම් නිල රථය දිස්ත්‍රික්කයෙන් පිට ප්‍රදේශයන්හි රාජකාරී සඳහා යාමේදී නිශ්චිත ලීටර් ප්‍රමාණයකට අතිරේක ඉන්ධන ලබා ගෙන ඇත. | අතිරේක ඉන්ධන ලබා ගැනීමට නම් එම ගමන්, මාසික ඉදිරි වැඩසටහන් හා කළ වැඩසටහන් මගින් අනුමත කරවා ගත යුතුව ඇති අතර අත රඳවාගෙන තිබුණු අතිරේක ඉන්ධන දීමනා ආපසු රජයේ ආදායමට බැර කළ යුතුය. |

**2.7 තැන්පත් ශේෂයන්**

---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පොදු තැන්පත් ගිණුමේ 2015 වර්ෂයේ සිට පැවත එන රු.මිලියන167.993 ක ශේෂයක් මාර්ග කාපට් ව්‍යාපෘති 102 කට අදාළව වැඩ නිම නොකිරීම මත තැන්පත් ගිණුමේ රඳවාගෙන වර්ෂ 06 ක් ගතවී තිබුණද අදාළ කාර්යයන් ඉටු කර නොතිබුණි. | මෙම රඳවුම් මුදල් නිදහස් කිරීමට අදාළව කමිටුවක් පත් කරඇති බවත්, මෙතෙක් එම කමිටු වාර්තාවට අදාළව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වී නොමැති බවත්, තාක්ෂණික නිර්දේශ ලබා දීමෙන් අනතුරුව අය විය යුතු අත්තිකාරම් මුදල් අය කිරීමෙන් පසු මෙම රඳවුම් නිදහස් කිරීමට හැකියාව පවතින බවත් දන්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් කඩිනමින් පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන අදාළ අත්තිකාරම් මුදල් අය කරගෙන රඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පොදු තැන්පත් ගිණුමක ඇතුළත් එකතුව රු.මිලියන 15.968 ක් වූ ව්‍යාපෘති 33 ක් වෙනුවෙන් අඩුකරගෙන තිබුණු රඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම රඳවුම් මුදල් නිදහස් කිරීමට අදාළව කමිටුවක් පත් කරඇති බවත්, මෙතෙක් එම කමිටු වාර්තාවට අදාළව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් වී නොමැති බවත්, තාක්ෂණික නිර්දේශ ලබා දීමෙන් අනතුරුව අය විය යුතු අත්තිකාරම් මුදල් අය කිරීමෙන් පසු මෙම රඳවුම් නිදහස් කිරීමට හැකියාව ඇත. | - එම - |
| (ඇ) | කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තැන්පත්කර තිබුණු එකතුව රු.මිලියන 7.185 ක ඉඩම් අත්පත් කර ගැනීම් වලට අදාළ තැන්පතු 17 ක් නොවිසඳී ඇති නඩු හේතුවෙන් වර්ෂ 10 කට වැඩි කාලයක සිට නිදහස් නොකර පොදු තැන්පත් ගිණුම් තුළ රඳවාගෙන තිබුණි. | තැන්පතු ශේෂය රු.7,185,450 ක් නිදහස් නොකිරීමට විවිධ හේතූන් බලපා ඇත. | තැන්පත් මුදල් නිදහස් කිරීමට බලපා ඇති හේතු නිරාකරනය කරගෙන සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මුදල් රෙගුලාසි 571(2) හා (3) ප්‍රකාරව රු. මිලියන 319.531ක් වූ කල් ඉකුත්වූ තැන්පතු ශේෂ සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ සමග එකඟ වන බව දන්වමි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් අදාළ මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර විගණනයට වාර්තා කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

**3.1** **සැලැසුම් කිරීම**
-------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | --------------------------------- | ----------- |
| (අ) | ගාල්ල දිස්ත්‍රික්කයේ නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ස්ථාපනයට රු. මිලියන 7.994 ප්‍රතිපාදන වෙන්වී තිබුණද ඒ පිළිබඳ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම තුළ අන්තර්ගතකර නොතිබුණි. | 2021 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන සැලැස්ම සකස් කරන අවස්ථාව වන විට රත්ගම, මාදම්පාගම හා වදුරඹ වශයෙන් නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3ක් භෞතික වශයෙන් නිශ්චිතව ස්ථාපිත කර නොතිබූ බැවින් 2021 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මට එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ඇතුළත් කර නොමැත. | නව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ස්ථාපිත කිරීමට අදාළ ගැසට් පත්‍රය 2019 ඔක්තෝබර් 29 දිනැති ගැසට් පත්‍රයක් බැවින් 2021 වර්ෂයේ ක්‍රියාත්මක සංවර්ධන සැලැස්මට එය ඇතුළත් කළ යුතුව තිබුණි. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්ම තුළ හෝල් ඩී ගෝල් ශාලාව, වර්ෂයේ ඉලක්කගත ශාලා වෙන් කිරීම් අවස්ථා 50 ක් වෙනුවෙන් රු.මිලියන 3.5 ක් ගාස්තු අයකර රජයේ ආදායමට බැර කිරීමට ඉලක්ක කර තිබුණද සත්‍ය වශයෙන් උපයාගෙන තිබුණු ආදායම රු. 687,000 ක් විය. | COVID 19 වසංගත තත්වය පාලන කිරීම සඳහා ගෙන තිබූ ක්‍රියා මාර්ග නිසා ඉලක්ක කර තිබූ ආදායම් මට්ටම කරා ළඟාවීමට නොහැකි වූ බව තවදුරටත් කාරුණිකව සඳහන් කරමි. | හෝල් ඩී ගෝල් ශාලාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ආදායම් උපයන මාර්ගය බැවින් එය කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කළ යුතුය. |

**3.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ව්‍යාපෘතිවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 කට අදාළව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 1,121.372 ක් වූ ව්‍යාපෘති 133 ක් ඉටු නොකර අත්හැර දමා තිබුණි. | පසුගිය වසරේ සමහර භාණ්ඩවල මිළ ගණන් අසාමාන්‍ය ලෙස ඉහළයාම, වෙළඳපොලේ සමහර භාණ්ඩ හිඟවීම ඇතුළු කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘති අතහැර දැමීම හා සංශෝධනය වීම සිදුවී තිබේ. | ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කිරීම ප්‍රායෝගික විය යුතු අතර එහි ඇතුළත් කරනු ලබන සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.මිලියන314.500 ක් වූ මුදලින් රු.මිලියන135.802 ක් වැයකර තිබූ අතර එය වෙන්කරන ලද ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස සියයට 43 ක් වැනි පහළ අගයක් වී තිබුණි. | මුල්‍ය ප්‍රකාශන 2021 හි **ACA-2(** ii**)** ආකෘතියේ දක්වා ඇති පැහැදිලි කිරීම් මෙයට අදාල බව කාරුණිකව දන්වමි. | වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කරගෙන රටේ සංවර්ධනයට ඉහල දායකත්වයක් ලබා දිය යුතුය. |

**3.4 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (අ), (ආ) සහ (ඇ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් වසර 03 ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල | ඉදිරි වර්ෂය සඳහා පමණක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම මෙතෙක් සිදු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

කළ යුතු වුවද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම 2021 වර්ෂය වෙනුවෙන් පමණක් පිළියෙල කර තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගාලු උරුමය පදනම වෙත ලබාදී තිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් 2019 ඔක්තෝබර් 14 දින නැවත පවරා තිබුණු අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128(ඉ) වගන්තියට අනුකූල වන පරිදි කටයුතු නොකිරීම හේතුවෙන් කැබ් රථය වර්ෂ 02 කට ආසන්න කාලයක සිට ගරාජයක් අසල දිරායමින් පැවතුණු බව නිරීක්ෂණය විය. රථයේ ලොග් සටහන් පොත අනුව සටහන් කළ යුතු තොරතුරුද දක්වා නොතිබුණි. | 2012 සිට 2019 දක්වා ගාලු උරුමය පදනමට අයත්ව තිබුණු අතර 2019 මැයි සිට ධාවනයෙන් ඉවත් කර තිබේ. ලොග් සටහන් පවත්වාගෙන යාම ගාලු උරුමය පදනමෙන් සිදු කළ යුතුය. | දීර්ඝ කාලයක් එළිමහනේ රථය දිරා යමින් තිබීමෙන් රථයේ වටිනාකම තවදුරටත් අඩුවන බැවින් කඩිනමින් අපහරණ කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල නිල නිවාස | | |
| (i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී වෙත වෙන් කර තිබුණු නිල නිවස 2004 වර්ෂයේ සිට අග්‍රාමාත්‍ය පෞද්ගලික ලේකම්වරයෙකුට හා හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකුගේ කාර්යාලයක් වශයෙන් පවත්වාගෙන ගොස් තිබුණි. 2015 නැවත දිස්ත්‍රික් ලේකම් වෙත පවරා දීම විධමත් පරිදි සිදු කර නොතිබුණි. | අග්‍රාමාත්‍ය පෞද්ගලික ලේකම් වෙත භාරදී නැවත රජයට භාරදී තිබූ නමුත් භාවිත කරන ලද්දේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙකි. මෙම දේපල විනාශ විමේ හා අන්සන්තක වීමේ අවදානමක් පැවති බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් භාරගැනීමට කටයුතු කර ඇත. | රජය සතු දේපල වෙනත් පාර්ශවයක ප්‍රයෝජනය සඳහා ලබා දීමේදී ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) මෙම ගොඩනැගිල්ල 2018 ජුනි 07 දින රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ගාලු උරුමය පදනමට ලබා දී තිබුණු අතර තක්සේරු | ගාලු උරුමය පදනම ව්‍යවස්ථාපිත ආයතනයක් වන බැවින් ව්‍යවස්ථාපිත ආයතනයක් වෙත කාර්යාලය පවත්වාගෙන යාමට | කඩිනමින් තක්සේරු වාර්තාවක් ලබාගෙන කුලී අය කිරිමක්කර විගණනයට වාර්තා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාවක් ලබාගෙන එකී මුදල ගිවිසුම්ගත කර කුලී පදනම මත අදාළ ආයතනයට ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් දන්වා තිබුණද, විගණන දිනය වූ 2022 මැයි 31 දක්වාම අදාළ තක්සේරු වාර්තා ලබාගෙන කුලී ගණනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර නොතිබුණි. | තාවකාලික පදනම මත මෙම ගොඩනැගිල්ල භාරදුන් බැවින් කොන්දේසි සහිත ගිවිසුමක් නොමැතිව ලබා දී ඇති අතර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කුලිය අය කිරීම සම්බන්ධව අවශ්‍ය උපදෙස් ඉල්ලා යැවූ ලිපියට පිළිතුරු ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් මෙම රජයේ නිවසට අදාලව තක්සේරුකරුගේ නිර්දේශය අනුව තක්සේරු වාර්තාවක් ලබාගෙන එකී මුදලට ගිවිසුම් ගතකර, කුලී පදනම මත ලබා දෙන ලෙස දන්වා ඇත. ලද උපදෙස් මත තක්සේරු වාර්තාව ලබා දෙන ලෙස ගාල්ල දිස්ත්‍රික් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇත.<br><br>වරිපනම් අංකයන් හි පවත්නා ගැටළුව නිසා තක්සේරු වාර්තා ලබා ගත නොහැකි වීම මත කුලී ගණනය ආරම්භ කිරීමේ හැකියාවක් නොමැති බැවින් තක්සේරු වාර්තා ලද පසු කඩිනමින් ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 අතුරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 කට අනුබද්ධව නිල නිවාස ස්ථාපනය කර තිබුණද, ඒ අතුරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක නිල නිවාස ඌණ උපයෝජිතව හෝ නිලධාරියාගේ පදිංචිය සඳහා භාවිතා කර නොතිබුණි. නිවාස ඉදිකිරීමේ අරමුණ වන ස්වකීය බල ප්‍රදේශයේ රාජකාරි කටයුතුවලට පහසුවක් ඇති කිරීම වුවද එම අරමුණ ඉටු වී නොතිබුණි. | බලපිටිය, බෝපෙ පෝද්දල, ගෝනාපිනුවල ප්‍රාදේශීය ලේකම් නිල නිවාසවල මේ වන විට පදිංචිව ඇත.<br><br>කරන්දෙණිය, බද්දේගම, නියාගම, නෙළුව, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් නිල නිවාස අළුත්වැඩියාවට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.<br><br>යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් නිල නිවස වෙනත් කටයුතු සඳහා යොදාගෙන ඇත. | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සේවය කාර්යක්ෂමව ලබා දීමේ චේතනාවෙන් ඉදිකර ඇති නිල නිවාස පදිංචිය සඳහාම උපයෝගී කරගත යුතුය. |

**3.6** **පාඩු හා හානි**

-----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහන 02 ක් අනතුරට ලක්ව තිබූ අතර එහි හානිය රු.217,600 ක් විය. ඉන් රු.141,650 ක් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබුණු අතර ඉතිරි මුදල රු.75,950 ක පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම අනතුරු සම්බන්ධයෙන් දැනට දිසා අධිකරණයේ නඩු දෙකක් විභාග වන අතර තීන්දුව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරමි. | නඩු තීන්දු ලැබුණු පසු ඉදිරි කටයුතු අවසන් කළ යුතුය. |

**3.7** **කළමනාකරණ දුර්වලතා**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ගිනි අවි 41 ක් සඳහා වර්ෂ 02 සිට වර්ෂ 13 දක්වා කාලයක සිට බලපත්‍ර ලබා ගෙන නොතිබුණු අතර ගිනි අවි පිළිබඳ විධිමත් පසු විපරමක් සිදු කර නොතිබුණි. තවද වයස අවුරුදු 65 සම්පූර්ණ වීමෙන් පසු බලපත්‍ර දීර්ඝ කර නොතිබුණු හා ගිනි අවි ආපසු භාර දී නොතිබුණු අවස්ථා 08 ක් හා වයස අවුරුදු 70 සම්පූර්ණ වීමෙන් පසු ගිනි අවි ආපසු භාර දී නොතිබුණු අවස්ථා 04 ක් විය. ගාල්ල හා ඇල්පිටිය පොලිස් අධිකාරීවරුන් වෙත ඒ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස දැනුම් දී තිබුණද එම කාර්යය සිදුකර නොතිබුණි | එම බලපත්‍රකරුවන්ට වාර්ෂිකව අළුත් කිරීමට අදාළව අවසන් නිවේදන යැවීමෙන් පසුව අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඇල්පිටිය/ ගාල්ල දැනුවත් කිරීම් වාර්ෂිකව සිදු කරනු ලබයි. | ලියාපදිංචි කර ඇති සියළුම ගිනි අවි, වාර්ෂිකව බලපත්‍ර අලුත් කිරීමේ කාලය අවසන් වීමට ප්‍රථම බලපත්‍ර ලබාගත යුතු බව ලිඛිතව දැනුම් දීමක් කළ යුතුය. බලපත්‍රලාභී ගිනි අවි ලාභීන්ගේ වයස සම්පූර්ණ වීමෙන් පසු ගිනි අවිය ආපසු භාරදීම සම්බන්ධයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2004 දෙසැම්බර් 26 දින ඇතිවූ සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ පුද්ගලයන්හට ගෝනාපිනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිවාස ප්‍රතිලාභීන් 26 දෙනෙකුට දීමනා පත්‍ර ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 03 දිනැතිව සිදු කරන ලද ජංගම සේවය යටතේ දැනට පදිංචිකරුවන් කාර්යාලය වෙත කැඳවා 2008/04 චක්‍රලේඛය අනුව මූලික පරීක්ෂණ පවත්වා ඇත. ඔවුන් සඳහා දීමනා පත්‍ර සකස් කිරීමේ කටයුතු ආරම්භකර ඇති අතර එය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි. | මේ දක්වා දීමනා පත්‍ර ලබා දී නොමැති පවුල් සඳහා පරීක්ෂණ පවත්වා සුදුසු පුද්ගලයන්ට දීමනා පත්‍ර ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබූ ඉඩම් හිමිකම් දීමනා පත්‍ර 66 න් 2021 දෙසැම්බර් 31 දින වන විටද දීමනා පත්‍ර 43 ක් බෙදාදී නොතිබුණි. එම දිමනා පත්‍ර අතරින් දීමනා පත්‍ර හිමියන් 4 දෙනෙක් මියගොස් තිබුණි. | උරුමකරුවන් පැහැදිලිව හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වේ. ඉදිරියේදී උක්ත දීමනාපත්‍ර උරුමකරුවන් වෙත භාර දීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම හෝ උරුමකරුවන් නොමැති දීමනාපත්‍ර ඒ බව තහවුරුකර ගැනීමෙන් අනතුරුව අවලංගු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බවත් කාරුණිකව සඳහන් කරමි. | ඉඩම් හිමිකම් දීමනා පත්‍ර බෙදා දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 198 බී ගොතටුව, 198 ඒ බද්දේගම දකුණ, 184 බද්දේගම උතුර සහ 1989 සී ඇල්ලකන්ද වතුරාව යන ග්‍රාම නිලධාරී වසම් වලට අදාළව 1981, 1983 සහ 1989 වර්ෂ වලදී ඉඩම් ප්‍රධාන විශේෂ විධිවිධාන පනත යටතේ නිකුත් කරන ලද නියාදන සාධන පත්‍ර 34 ක් අදාළ ප්‍රතිලාභීන්ට නිකුත් කිරීමට නොහැකිව කාර්යාලයේ රඳවාගෙන තිබුණි. | නියාදන සාධන පත්‍ර 29 ක් සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂා කර බැලීමෙන් පසු අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරි නියාදන සාධන පත්‍ර සම්බන්ධයෙන් පුද්ගලයන් සමග එකඟතාවයකට පත්වීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | නියාදන සාධන පත්‍ර කාලීනව ප්‍රතිලාභීන්ට ලබා දිය යුතු අතර එසේ ප්‍රදානය කිරීමට නොහැකි අවස්ථාවලදී සුදුස පරිදි කටයුතුකර නියාදන සාධන පත්‍ර අවලංගු කළ යුතුය. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දින වන විට හබරාදුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බලපත්‍රලාභීන් 20 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට අය විය යුතු හිඟ සුරාබදු බලපත්‍ර ආදායම (ප්‍රමාද ගාස්තු සමග) රු.මිලියන 22.368 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ආයතන 18 ක් සුරාබදු | බලපත්‍ර අළුත් නොකළ බලපත්‍රලාභීන් පිළිබඳ තොරතුරු සුරාබදු කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දීම, සුරාබදු බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා සියලුම සුරාබදු බලපත්‍රලාභීන් වෙත ලිඛිතව දන්වා යැවීම හා බලපත්‍ර ගාස්තු, හිග ගාස්තු හි | සුරාබදු බලපත්‍ර ගාස්තු හා ප්‍රමාද ගාස්තු අය කර ගැනීම ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇති බැවින් දක්වා ඇති හිඟ බලපත්‍ර ගාස්තු අයකර තැනීමට කටයුතු කළ යුතු අතර සුරාබදු |

| | | |
|---|---|---|
| නිවේදන 902 හි 7 වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තු ගෙවා සුරාබදු බලපත්‍ර ලබානොගෙන ව්‍යාපාර කටයුතු සිදු කරගෙන ගොස් තිබුණි. | ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කිරීම යන කාර්යයන් අප වෙත පැවරී ඇති කාර්යයන් වේ. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නොමැති අතර සුරාබදු දෙපාර්තමේන්තුව මේ සම්බන්ධයෙන් කටයුතු කල යුතු බව දන්වමි. | කොමසාරිස් දැනුවත් කිරීමටත් කටයුතු කළ යුතුය.. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරය හා සම්බන්ධවන උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යභාරය හා සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක් හඳුනාගෙන තිබු අතර එම කාර්යාලවල 2021 වර්ෂයට ක්‍රියාත්මක සැලසුම්ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක සැලැස්මට ඇතුලත් කර තිබිණි. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන බාහිර පාර්ශවයන් හඳුනාගත යුතුය. |
| (ආ) | 2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරන තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපායමාර්ගික කළමනාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ළඟා කර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වෙත යොමු කර නොතිබුණි. | තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් මේ පිළිබඳ විමසා ඇතත් එහිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිලධාරින් නම් කිරීමක් සිදුකර නැත.මේ වන විට එම අමාත්‍යාංශයද ක්‍රියාකාරි මට්ටමින් ක්‍රියාත්මක නොවන බැවින් වැඩිදුර උපදෙස් ලබා ගැනීමටද ආයතනයක් නොමැත.මේ වන විට මෙම විෂය පථය අයත් අමාත්‍යාංශය නිලධාරීන් නම් කිරීම අපේක්ෂා කරන්නේ නම් නිලධාරීන් නම් කිරීමේ හැකියාව පවතින බවද දන්වමි. | අදාළ චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 05 ක, තෘතීක මට්ටමේ නිලධාරීන් 22 ක හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 03 ක පුරප්පාඩු පවතී. ද්විතීක මට්ටමට අයත් සංවර්ධන නිලධාරීන් 114 ක, තොරතුරු තාක්ෂණ සහකාර තනතුරේ නිලධාරීන් 10 ක හා සංවර්ධන සම්බන්ධීකාරක තනතුරේ නිලධාරීන් 01 ක අතිරික්තයක් පවතින අතර තාක්ෂණ සේවා නිලධාරී තනතුරු 15 ක, කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 55 ක, ග්‍රාම නිලධාරී තනතුරු 146 ක හා ව්‍යාපෘති නිලධාරී තනතුරු 02 ක පුරප්පාඩු පැවතිණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත අනුමත කාර්යමණ්ඩලයට අයත් නිලධාරීන් කිසිවෙකුගේ පත්වීම් බලධාරීත්වය දිසාපතිවරයාට නොමැත.<br><br>විධිමත් පරිදි පුරප්පාඩු පිරවීමේ බලය දිස්ත්‍රික් ලේකම්හට නොමැති බැවින් එකී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා වන වාර්තා අදාළ පත්වීම් බලධාරීන් වෙත යැවීම මනාව ඉටු කොට ඇත. | විධිමත් පරිදි පුරප්පාඩු පුරවා ගැනීමට හා අතිරික්ත කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) (i) වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් එක් අංශවලට අනුයුක්තව නිලධාරීන් 189 ක් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තියක් විධිමත්ව ක්‍රියාත්මක කර නොමැති අතර නිලධාරීන් 35 ක් මුල් පත්වීම් දිනයේ සිට වසර 08 ක කාලයක් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම සේවයේ යෙදී සිට තිබුණි. | මෙම කාර්යාලයෙහි කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, තාක්ෂණ නිලධාරීන්, කාර්යාල කාර්යය සහායක නිලධාරීන් මෙන්ම වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් අනුයුක්ත නිලධාරීන් ද සේවයෙහි නියුක්තව ඇති අතර ඔවුන්ගේ ස්ථාන මාරු කිරීම් හා අභ්‍යන්තර අනුයුක්ත කිරීම් සිදු කරනු ලබන්නේ ඒ ඒ ආයතන ප්‍රධානීන් විසින් බව කාරුණිකව සඳහන් කරමි. | විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | නිලධාරීන් 5 දෙනෙකු අවස්ථා 02 සිට අවස්ථා 06 ක් දක්වා වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කර තිබුණද ස්ථාන මාරුවීම් ලබා නොදීම හේතුවෙන් එකී නිලධාරීන් වර්ෂ 06 සිට වර්ෂ 21 දක්වා කාලයක් වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේම සේවය කර තිබුණි. | වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරනු ලබන සියළුම නිලධාරීන්ගේ ඉල්ලුම් පත් නිර්දේශ කොට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත හා ඒ ඒ ආයතන ප්‍රධානීන් වෙතද, දිස්ත්‍රික් ලේකම් වෙතද යොමු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරනු ලබන අතර, 2022 වර්ෂයට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරන ලද නිලධාරීන් අතුරින් එක් කළමනාකරණ සේවා නිලධාරිනියක් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරු කොට ඇති බව කාරුණිකව සඳහන් කරමි. | විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. |